
# Game Development for Beginners

ඔබේ Portfolio එක නිවැරදිව සකස් කරගැනීමට අත්‍යවශ්‍ය කරුණු




Trainer: Ranga Pushpakumara

# Introduction - හැඳින්වීම

Portfolio එකක් යනු Game Developer කෙනෙකු සතු වටිනාම වත්කමයි. එය ඔබගේ CV එකටත් වඩා ප්‍රබල වන අතර, ඔබ සතු තාක්ෂණික හැකියාවන් ලෝකයට පෙන්වන ප්‍රධාන මාධ්‍යය වේ.


## 1. Portfolio එකක වැදගත්කම

- Professional Showcase: මෙය ඔබ නිර්මාණය කළ දේවල් ප්‍රදර්ශනය කරන ස්ථානයයි.
- Problem Solving Skill: ඔබ ගැටළු විසඳන ආකාරය සහ ඔබ හිතන විදිහ (Thought Process) මෙහිදී හඳුනාගත හැක.
- Capabilities: ඔබ සතු හැකියාවන්ගේ මට්ටම (Level of Expertise) Client කෙනෙකුට හෝ ආයතනයකට පෙන්වීමට ඇති හොඳම ක්‍රමය මෙයයි.

## 2. Portfolio එකට ඇතුළත් කළ යුතු දේ

ඔබ සතුව විශාල ක්‍රීඩා සංඛ්‍යාවක් තිබීම අවශ්‍ය නොවේ. වැදගත් වන්නේ පවතින දේවල්වල ගුණාත්මකභාවයයි.

- Quality over Quantity: Well-polished ක්‍රීඩා 1-3 ක් තිබීම ප්‍රමාණවත්ය.
- Juicy Experience: ක්‍රීඩාවේ Visuals, Audio සහ Game Play එක උසස් මට්ටමක පවත්වා ගන්න.
- Detailed Descriptions: "මම Flappy Bird Clone එකක් හැදුවා" යනුවෙන් පමණක් නොදක්වා, එහි අඩංගු වූ දේවල් (Physics, Scoring system, Health system, UI panels, Particle effects, Animations) පිළිබඳව පැහැදිලි විස්තරයක් ඇතුළත් කරන්න.




## 3. ප්‍රායෝගික ප්‍රවේශය (Playable Demos & Media)

ඔබේ Portfolio එක බලන පුද්ගලයාට ක්‍රීඩාව අත්විඳීමට පහසු ක්‍රම ලබා දෙන්න:

- Playable Link: Browser එක තුළ Play කළ හැකි WebGL Version එකක් (Itch.io වැනි අඩවියක) ලබා දීම ඉතා සුදුසුයි. එවිට ඔවුන්ට ක්‍රීඩාව Download කිරීමට අවශ්‍ය නොවේ.
- Video Demo: ක්‍රීඩාවේ හොඳම අවස්ථා ඇතුළත් තත්පර 30-60ක වීඩියෝ ක්ලිප් එකක් එක් කරන්න.
- Screenshots: ක්‍රීඩාවේ විවිධ අවස්ථා දැක්වෙන පැහැදිලි Screenshot ඇතුළත් කරන්න.

## 4. රැකියා අවස්ථාවකදී Portfolio එක බලන ආකාරය

ඔබ සම්මුඛ පරීක්ෂණයකට යන විට, ඔවුන් බලන්නේ ඔබ කළ දේ පමණක් නොව, එය කළේ ඇයි සහ කෙසේද යන්නයි. ඒ සඳහා පහත කරුණු Highlight කරන්න:

- Goal: මෙම ව්‍යාපෘතියෙන් ඔබ සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කළ දේ.
- Challenges: ව්‍යාපෘතිය අතරතුර ඔබ මුහුණ දුන් අභියෝග.
- Solutions: එම අභියෝග ඔබ ජය ගත්තේ කෙසේද? (Problem solving approach).
- Learning: මෙම ව්‍යාපෘතියෙන් ඔබ අලුතින් ඉගෙන ගත් දේ.
- Future Improvements: අනාගතයේදී මෙය තවදුරටත් දියුණු කරන්නේ කෙසේද යන අදහස.

## 5. Portfolio Hosting Platforms

- **GitHub:** Source code පෙන්වීමට සහ Project ශෙයා කිරීමට.

- **Itch.io:** ක්‍රීඩා Host කිරීමට සහ Play කිරීමට Link ලබා දීමට.

- **ArtStation / Behance:** Game Art සහ Visuals පෙන්වීමට.

- **Google Sites / Notion / Custom Website:** සම්පූර්ණ Portfolio එක එකම තැනක ප්‍රදර්ශනය කිරීමට.

## 6. Maintenance

- Keep Updating: අලුත් දෙයක් ඉගෙන ගත් සෑම විටම හෝ අලුත් Project එකක් නිම කළ විට Portfolio එක යාවත්කාලීන කරන්න.
- Re-build Old Projects: ඔබ අලුතින් ඉගෙන ගත් දේ පාවිච්චි කර පැරණි Project එකක ක්‍රියාකාරීත්වය (Performance) වැඩි දියුණු කර අලුත් Version එකක් ඇතුළත් කරන්න.